# 10 වන දවස

## ඔබගේ ශ්‍රී නාමය සුවිශුද්ධ වේවා !

දෙවියන් වහන්සේ ශුද්ධ ය, වෙනස් ය. එහෙත් ප්‍රේමවන්ත පියාණෝ ය. ශුද්ධ නිසා පූර්ණව යුක්ති සහගත ය, සාධාරණ ය, භයංකාර ය. එහෙත් දෙවිඳාණෝ ප්‍රේමය වන නිසා කරුණාවන්ත ය. ඉවසන සුළු ය. ශුද්ධ නිසා ළංවිය නොහැක. එහෙත් ප්‍රේමය නිසා අප සමග ජීවත් වන සේක. සමාව, දයාව, කරුණාව පෙන්වන සේක. අපව ළංකර ගන්න සේක. **''ප්‍රේම නොකරන්නා දෙවියන් වහන්සේ ව නාඳුනයි. මන්ද දෙවියන් වහන්සේ ප්‍රේමය ය''** (1 ජොහාන් 4:8). දෙවියන් වහන්සේ අපට ප්‍රේම කරන බව අප දැනගන්නේ ස්ව ඒකජාත පුත්‍රයාණන් අපගේ ගැළවීම උදෙසා එවා වදාළ නිසා ය. දෙවියන් වහන්සේ අපගේ ප්‍රේමණීය පියා බව අපට ඉගැන්වූයේ ක්‍රිස්තුන් වහන්සේ ය. දෙවියන් වහන්සේ ප්‍රේමවන්ත නිසා අපව ඉවසන සේක. ඔවුන් වහන්සේ ශුද්ධ නිසා අපට දක්වන ආදරය තේරුම් ගත නොහැක. ක්‍රිස්තුන් වහන්සේ ශුද්ධවූ දෙවියන් වහන්සේගේ ශුද්ධවූ ආදරය ගැඹුරින් ම අත්දුටුවේ කුරුස ගසේදීය කිවහොත් එය අපගේ ඥානයට ගෝචර නැත. නමුත් එසේ ම විය. අප වේදනා විඳින විට සහ ගැඹුරු තනිභාවය අත්දකින විටත් දෙවියන් වහන්සේ මේවාට ඉඩදී ඇත්තේ අපගේ ම යහපතට බව පිළිගනිමින් සිදුවන දෙයට 'එහෙයි' කියමු.

**දවස පුරා :-** ✵ අද දින අප අත්දකින හැම දෙයකට ම ''ප්‍රශංසා වේවා'' කියා කියමු.

✵ පුබුදු ගීතාංජලී ගී අංක 134